# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2299/44 – 2022 සැප්තැම්බර් 28 වැනි බදාදා – 2022.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2016/143.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.04.10 වැනි දින අංක 2222/71 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.04.01 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

සීතා විජේසූරිය මිය, "ශාන්ති" , තලාවිටිය, පරකඩුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

අතර පවත්නා 2021.03.31 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ පාරින්ද මනෝජ් වීරසිංහ මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ පාරින්ද මනෝජ් වීරසිංහ මහතා එම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.04.01 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0326/1

---

මගේ අංකය: IR/COM/03/2016/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

සීතා විජේසූරිය මිය, "ශාන්ති", තලාවිටිය, පරකඩුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිචඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/03/2016/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

සීතා විජේසූරිය මිය, "ශාන්ති", තලාවිටිය, පරකඩුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ සීතා විජේසූරිය මිය 1994 වර්ෂයේ එම සංස්ථාව, අධිකාරියක් බවට පත් කිරීමේ දී අතිරික්ත සේවිකාවක් වශයෙන් සලකා නියමිත වයස එළඹෙන්නට ප්‍රථම පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත් වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන මොනවා ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 - 0326/2

---

මගේ අංකය: IR/COM/04/2020/144.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.04.08 වැනි දින අංක 2274/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.03.30 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජේ.එච්.සිසිර සමන් කුමාර මයා, 45/5ඒ, කාවින්දි, බූකැන්ද යාය, කටුවන.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක් හවුස් පටුමඟ, කොළඹ 15.

අතර පවත්නා 2022.03.29 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ පාරින්ද මනෝජ් වීරසිංහ මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ පාරින්ද මනෝජ් වීරසිංහ මහතා එම ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය

අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.03.30 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0327/1

---

මගේ අංකය: IR/COM/04/2020/144.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජේ.එච්. සිසිර සමන් කුමාර මයා, 45/5 ඒ, කාවින්දි බූකැන්ද යාය, කටුවන.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක් හවුස් පටුමඟ, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, අංක 32/26 එල්, එම්.එම්.අයි.ආර්.ඒ. ජයතිලක මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/04/2020/144.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජේ.එච්. සිසිර සමන් කුමාර මයා, 45/5ඒ, කාවින්දි, බූකැන්ද යාය, කටුවන.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක් හවුස් පටුමඟ, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු** වනුයේ,

''ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවයේ නියුතු ජේ. එච්. සිසිර සමන් කුමාර මයා හට ගබඩා භාරකරු අධිශ්‍රේණිය 1 වන JM 1-1 ශ්‍රේණිය තනතුර හිමි ද, හිමි නම් ඒ කවරදාක සිට ද එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 - 0327/2